ලංකා බැංකුව

යනු ලන්ඩනයේ පිහිටා ඇති අනුබද්ධිත බැංකුව ඇතුළු විදේශ රටවල ක්‍රියාත්මක වන හා දිවයින පුරා දිවෙන පුළුල් ශාඛා ජාලයක් සහිත ශ්‍රී ලංකාවේ විශාලතම බැංකු ආයතනය යි. ලොව ප්‍රමුඛපෙළේ බැංකු සන්නාම 500 අතරට ශ්‍රේණිගත කර ඇති එකම ශ්‍රී ලාංකික බැංකුව වන අප, ශ්‍රී ලංකාවේ අංක 01 බැංකු සන්නාමය ද වේ.

පහත දැක්වෙන තනතුරේ ඇති පුරප්පාඩු සඳහා ක්‍රියාශීලී මෙන්ම සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ;

අභ්‍යාසලාභී සංවර්ධන සහකාර

(මධ්‍යම, නැගෙනහිර, උතුරු, උතුරු මැද, වයඹ, සබරගමුව සහ ඌව පළාත්වල පමණක් පුරප්පාඩු පවතී)

ප්‍රධාන වගකීම්

1. **නිමැවුම් ප්‍රවර්ධනය සහ ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම**

   සුදුසු ඉලක්කගත ගනුදෙනුකාර කණ්ඩායම් හඳුනාගෙන ඔවුන් වෙත ක්ෂුද්‍ර මූල්‍ය සේවා හඳුන්වා දීම සහ එම සේවාවන් තිසි පරිදි භාවිත කිරීම පිළිබඳව මනා අවබෝධයක් ලබා දීම.

2. **ගනුදෙනුකරුවන් සමඟ සබඳතා පැවැත්වීම**

   ගනුදෙනුකරුවන් සමග ආචාරශීලීව සන්තිවේදනය පවත්වා ගනිමින් සමීප හා විශ්වාසනීය සබඳතා ගොඩනඟා ගෙන පවත්වාගෙන යාම

3. **ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හඳුනාගැනීම**

   ගනුදෙනුකරුවන්ගේ නිශ්චිත අවශ්‍යතා හඳුනාගෙන, ඒවා සපුරාලීම සඳහා වඩාත් සුදුසු බැංකු නිමැවුම් යෝජනා කිරීම

4. **ණය ඇගයීම**

   ණය දීම පිළිබඳ තීරණ ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමට නිර්දේශ කිරීම සහ එම ණය අයදුම්පත් පරීක්ෂා කර බලා ශාඛා කළමනාකරු වෙත තීර්දේශ ඉදිරිපත් කිරීම

5. **ආයතනික සම්බන්ධීකරණය**

   ගනුදෙනුකරුවන්ට සහාය වීම සඳහා බැංකුව සහ විවිධ රජයේ සහ රාජ්‍ය නොවන ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

6. **ණය අධීක්ෂණය කිරීම**

   ණය මුදල් අදියර වශයෙන් නිකුත් කිරීමට නිර්දේශ කිරීම සහ එම ණය මුදල ලබාගත් අරමුණ සඳහාම නිවැරදිව භාවිත කරනවාදැයි තහවුරු කරගැනීම සඳහා පරීක්ෂා කිරීම

7. **වෙළඳපළ පිළිබඳ දැනුවත්භාවය**

   අපේක්ෂිත ගැනුම්කරුවන් වෙත අලෙවිකරණ අවස්ථා හා ව්‍යාපාරික හවුල්කාරිත්වයන් හඳුනාගෙන සාද නිමකරන ලද භාණ්ඩ පිළිබඳ දැනුවත් කිරීම

8. **ණය අයකර ගැනීම හා තැන්පතු එක් රැස් කිරීම**

   ණය ගැනියන් හමුවීමට ගොස් ණය එකතු කිරීම සහ අයකර ගැනීම මෙන්ම, ඔවුන්ගේ ආදායම් උත්පාදන කටයුතු පදනම් කර ගනිමින් ග්‍රාමීය මට්ටමින් තැන්පතු (මුදල්) රැස් කිරීමය.

9. **ක්ෂේත්‍ර මෙහෙයුම් සහ වාර්තාකරණය**

   බැංකුවේ නීතිරීතිවලට අනුකූලව දත්ත රැස්කිරීම, වාර්තා ඉදිරිපත් කිරීම සහ ක්ෂේත්‍ර ලේඛන කටයුතු පවත්වාගෙන යාම

10. **වෙනත් රාජකාරි**

    ශාඛා කළමනාකරු විසින් උපදෙස් දෙන පරිදි වෙනත් ඕනෑම කාර්යයක් හෝ ක්ෂේත්‍ර පැවරුමක් ඉටුකිරීම.

සුදුසුකම් නිර්ණායක

☞ **ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය**

☞ **අධ්‍යාපන සුදුසුකම් :**

අවම වශයෙන්, රජයේ ආයතනයකින් ලබාගත් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා සහතිකය (අවම වශයෙන් වසර දෙකක කාලයක් පූර්ණකාලීනව හැදෑරූ)

හෝ

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන්සභාවේ (TVEC) ලියාපදිංචි ඕනෑම පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද අවම වශයෙන් වසර දෙකක කාලයක් පූර්ණ කාලීනව හැදෑරූ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6ට (NVQ 6) සමාන කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාවක්.

හෝ

අවම වශයෙන්, රජයේ ආයතනයකින් හෝ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන්සභාවේ (TVEC) ලියාපදිංචි ඕනෑම පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා සහතිකය (අවම වශයෙන් වසරක කාලයක් පූර්ණ කාලීනව හැදෑරූ) සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02ක සේවා පළපුරුද්ද තිබීම

☞ **යතුරුපෑදි පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.**

☞ **වෙනත් ගුණාංග**

- ඉහළ මට්ටමේ අන්තර් පුද්ගල සම්බන්ධතා සහ සන්තිවේදන හැකියාව
- දැඩි උත්සාහය සහ කැපවීම සහිත පුද්ගලයකු වීම
- කාලානුබද්ධ ඉලක්ක අනුව සේවය කිරීමේ හැකියාව

☞ **වයස**

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය වන විට වයස අවුරුදු 30 හෝ ඊට අඩු විය යුතුය.

සාමාන්‍ය :

- ❍ පුහුණු කාලසීමාව වසර දෙකක් (02) වන අතර, මෙම පුහුණු කාලසීමාව තුළ මාසික දීමනාවක් (1 වන වසරේදී - මසකට රු. 60,000/- සහ 2 වන වසරේදී - මසකට රු. 75,000/-) ගෙවනු ලැබේ.
- ❍ මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත්වන නමුත් සාමාන්‍ය බැංකු ක්ෂේත්‍රයෙන් පරිබාහිර (සංවෘත සේවය) වේ.
- ❍ බැංකුව සැහීමට පත්වන පරිදි පුහුණු කාලසීමාවේ අවශ්‍යතා සපුරාලීමෙන් පසු, බැංකුවේ ස්ථිර සේවයේ සංවර්ධන සහකාර - 1 ශ්‍රේණියෙහි (බැංකු නොවන) ස්ථිරකරනු ලැබේ.
- ❍ බැංකුවේ කළමනාකරීත්වය විසින් වෙනත් ආකාරයකින් තීරණය කරන්නේ නම් මිස, අභ්‍යාසලාභීන් තමාව අනුයුක්ත කර ඇති පළාතේ, අවම වශයෙන් වසර දහයක (10) [වසර දෙකක (02) පුහුණු කාලය ද ඇතුළුව] අනිවාර්ය කාලයක් සේවය කළ යුතුය.

තෝරාගැනීමේ ක්‍රමවේදය:

- ඉහත සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතරින් සම්මුඛ පරීක්ෂණයක් මගින් අපේක්ෂකයින් පිරිසක් තෝරාගනු ලැබේ.
- තෝරාගැනීම් සිදු කරනුයේ අදාළ පළාත් හතේ අවශ්‍යතාවන් මත පදනම්ව ය.

අයදුම් කිරීමේ ක්‍රමවේදය:

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk ("Careers" තීරය යටතේ) වෙතින් බාගත කරගත හැකි ආදර්ශ අයදුම්පත භාවිත කරමින් සකසන ලද ඔබගේ ජීවදත්ත පත්‍රිකාව, පහත සඳහන් ලේඛනවල ඡායා පිටපත් ද සමග **2026.07.25 දින හෝ ඊට පෙර** අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** යොමු කළ යුතු අතර අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කළ තනතුර සහ පළාත සඳහන් කළ යුතුය:

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය තහවුරු කරන වෙනත් ඕනෑම සාක්ෂියක්
iii. යතුරු පෑදි පැදවීම සඳහා වූ වලංගු රියදුරු බලපත්‍රය
iv. කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (වසර 1 හෝ 2 - පූර්ණ කාලීන) සම්පූර්ණ කිරීමේ සහතික පත්‍රය හා ප්‍රතිඵල සටහන් ලේඛනය
v. ඔබේ පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිඛිත සාක්ෂි (වසර 1 ක ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර ඇති අයට පමණි)
vi. වෙනත් යම් අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම්

ඉහත ක්‍රමයෙන් හැර වෙනත් ක්‍රමයන්ගෙන් ලැබෙන අයදුම්පත් කුමන හේතුවක් මත හෝ භාරගනු නොලැබේ.

මධ්‍යම, නැගෙනහිර, උතුරු, මැද, වයඹ, උතුරු, සබරගමුව සහ ඌව යන පළාත්වල පමණක් පුරප්පාඩු පවතින අතර අයදුම් කිරීමේදී අපේක්ෂකයා විසින් එක පළාතක් පමණක් සඳහන් කළ යුතුය. එක් පළාතකට වඩා සඳහන් කිරීම අයදුම්කරු නුසුදුස්සකු වීමට හේතු වේ

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරානොමැති හෝ අදාළ සනාථකිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව ඉදිරිපත්කරන හෝ අවසන් ප්‍රතිඵල නිකුත් වී නොමැති හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසු දිනයක සුදුසුකම් සම්පූර්ණ කරන හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත්කරන හෝ ඕනෑම අයදුම්පතක්, බඳවාගැනීමේ ඕනෑම අදියරකදී කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. යම් අයදුම්කරුවකු විසින් සාගතිකපත් තහවුරුකරන අවස්ථාවේදී ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සනාථකිරීම සඳහා ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ/ඇයගේ අයදුම්පත වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරු විසින් අපගේ වෙබ් අඩවිය ඔස්සේ පිවිසිය හැකි මානව සම්පත් කළමනාකරණ පිටුවේ (https://www.boc.lk/hr-management) ඇති "බඳවාගැනීම් සඳහා වන පෞද්ගලික දත්ත ආරක්ෂණ දැන්වීම" අයදුම්කරන අවස්ථාවේදී කියවා එය පිළිගත යුතුය.

ප්‍රධාන කළමනාකරු (බඳවාගැනීම් හා වෘත්තීය සංවර්ධන)
මානව සම්පත් මෙහෙයුම්,
ලංකා බැංකුව, ප්‍රධාන කාර්යාලය, කොළඹ 01.

- බැංකුව වෙත කුමන අයුරකින් හෝ බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසු බවට පත්කිරීමට හේතුවේ.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවාගැනීම කල්දැමීමේ/ අවලංගුකිරීමේ අයිතිය බැංකුව සතුය.
- පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂාකරනු ලැබේ.